**ශීර්ෂය 194 - විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

----------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 194- විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

-------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,440.55 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 858.61 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 581.94 ක් හෙවත් සියයට 40 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 101.74 | 94.14 | 7.60 | 7.47 |
| මූලධන | 1,338.81 | 764.47 | 574.34 | 42.90 |
| **එකතුව** | **1,440.55** | **858.61** | **581.94** | **40.40** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 19401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.00 | 1.44 | 0.20 | 1.15 | 20.00 | 3.73 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0419/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 0.06 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන 6000/0000/00/0013/0110/000 දරන තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 0.07 ක් විය.

2.5 **විගණන නිරීක්ෂණය**

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. මිලියන 120.45 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 24 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සියයට 12 ක සිට සියයට 89 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.2 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අමාත්‍යාංශය විසින් තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමේදී කාර්යයට අදාළ අත්තිකාරම් සඳහා ඇස්තමේන්තු ලබා ගැනීමෙන් තොරව, අත්තිකාරම් නිකුත් කිරීම නිසා කාර්ය නිම කළ පසු ඉතිරිය අවස්ථා 15 කදී සියයට 41 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.3.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2015 සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.3.2 අභ්‍යන්තර විගණනය

මෙම අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. ඉල්ලුම් කළ පරිදි අමාත්‍යාංශය වෙත අභ්‍යන්තර විගණන නිලධාරියෙකු අනුයුක්ත නොකිරීම නිසා අභ්‍යන්තර විගණන අංශය ස්ථාපනය කිරීමට නොහැකි වූ බව ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබුණි.

### 3.3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.4 බේරුම් නොකළ බැරකම්

2015 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් බේරුම් නොකළ වර්ෂ එකකට අඩු කාලයක සිට පැවැත එන බැරකම් රු. මිලියන 301 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මුදල් රෙගුලාසි 94(1) ට අනුකූල නොවී වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 43 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.5 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

(අ) **පාසල් පරිගණක විද්‍යාගාර ව්‍යාපෘතිය**

ඉකුත් වර්ෂයේ ක්‍රියාත්මක වූ විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය විසින් ඉටු කරන ලද ඉහත සඳහන් ව්‍යාපෘතිය 2015 සැප්තැම්බර් 21 දින සිට විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. 2014 වර්ෂයෙන් 2015 වර්ෂයට අවිච්ඡේද වූ කාර්යයන්ද, 2015 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවැති කාර්යයන්වලද ප්‍රගතිය පහත දැක්වේ.

| **විස්තරය** | **2015** | **2014 වර්ෂයෙන් අවිච්ඡේද වූ 2015 වර්ෂයේදී නිම කළ යුතු විද්‍යාගාර සංඛ්‍යාව** | **ප්‍රතිපාදනය** |
|---|---|---|---|
| | | | **රු.මිලියන** |
| ඉදිකිරීමට අපේක්ෂිත විද්‍යාගාර සංඛ්‍යාව | 79 | 138 | 400 |
| භෞතික ප්‍රගතිය | 39 | 136 | 248 |
| **ඉතිරිය** | **40** | **2** | **152** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී ආරම්භ කර 2015 දෙසැම්බර් 31 දින දක්වා පරිගණක විද්‍යාගාර පාසල් 684 ක් ඉදිකිරීමට ඉලක්ක ගත කර තිබුණි. ඉන් පාසල් 444 ක් දැයට කිරුළ වැඩසටහනට සමගාමීව කෑගල්ල, අම්පාර, අනුරාධපුරය යන දිස්ත්‍රික්ක 03 හි පමණක් ආවරණය කර තිබුණි. එය ඉලක්ක ගත ඉදිකිරීම්වලින් සියයට 65 ක ප්‍රමාණයක් වී තිබුණි. ඉතිරි සියයට 35 ක ප්‍රමාණය දිස්ත්‍රික්ක 22 ක් ආවරණය වන පරිදි සැලැසුම් කර තිබුණි.

(ii) සෑම පාසල් පරිගණක විද්‍යාගාරයක් සඳහාම එක් පාසලකට ගුරුවරුන් දෙදෙනෙකු බැගින් පුහුණු කිරීම ඉලක්කය වී තිබුණි. ස්ථාපිත කරන ලද පාසල් පරිගණක විද්‍යාගාර 93 ක් සඳහා ගුරුවරුන් දෙදෙනෙකු බැගින් ගුරුවරුන් 186 ක් පුහුණු කළ යුතු වුවද, පුහුණු කරන ලද ගුරුවරු සංඛ්‍යාව 152 ක් පමණක් විය. 2015 වර්ෂයේදී කළුතර හා මාතර දිස්ත්‍රික්කයන්හි ස්ථාපිත කරන ලද විද්‍යාගාර 44 ක් සඳහා පුහුණුවීම් කළුතර දිස්ත්‍රික්කයේ ගුරුවරුන් 25 දෙනෙකු සඳහා පමණක් ලබාදී තිබුණි. සැලැසුම් කළ පරිදි ගුරුභවතුන් සියළුම දෙනා පුහුණු කිරීමට අපහසු වී ඇති අතර ගුරු පුහුණුව ලබා නොගත් පාසල්වල ගුරුභවතුන් සඳහා පුහුණු වැඩමුළුවක් ඉදිරියේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව අමාත්‍යාංශයේ ලේකම්වරයා මා වෙත දන්වා තිබුණි.

(iii) පාසල් පරිගණක විද්‍යාගාර තෝරා ගැනීමේදී වෙනත් ව්‍යාපෘතියක් යටතේ පාසල් පරිගණක විද්‍යාගාරයක් නොලැබුණු පාසල් පමණක් තෝරා ගතයුතු වුවත්, ව්‍යාපෘතිය විසින් පාසල් තෝරා ගැනීමේදී එයද සලකා බැලීමක් කර නොතිබුණි.

(iv) අම්පාර දිස්ත්‍රික්කයේ පාසල් පරිගණක විද්‍යාගාර 125 ක් ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී යෝජිතව පැවතුණද, 2015 දෙසැම්බර් 31 දිනට පාසල් 93 ක් පමණක් විවෘත කර තිබුණි. එහි ප්‍රගතිය සියයට 74 ක් වී තිබුණි.

(v) අම්පාර දිස්ත්‍රික්කයේ පාසල් සඳහා මිලදී ගැනීමට ගිවිසගෙන තිබූ පරිගණක හා උපාංග 2015 වර්ෂයේ මාතර හා කළුතර දිස්ත්‍රික්කයන්හි පිහිටුවන ලද පාසල් පරිගණක විද්‍යාගාර සඳහා බෙදා හැර තිබුණි. මේ හේතුවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ පාසල් 32 ක් සඳහා 2016 පෙබරවාරි 25 දින වන විටත් පරිගණක හා උපාංග මිලදී ගෙන නොතිබුණි. එසේ වුවත්, පරිගණක සැපයීමට පෙර පාසල් 16 ක ජාල ගතකිරීම සිදුකර තිබුණි.

**(ආ) දිස්ත්‍රික් තොරතුරු මධ්‍යස්ථාන ඉදිකිරීම**

දිස්ත්‍රික් තොරතුරු මධ්‍යස්ථාන ඉදිරිකිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර, එමගින් දිවයින පුරා දිස්ත්‍රික් තොරතුරු මධ්‍යස්ථාන 25 ක් ඉදිකිරීමට සැලැසුම් කර තිබුණි. ව්‍යාපෘතිය ඉකුත් වර්ෂයේදී විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී තිබුණි. 2015 සැප්තැම්බර් 21 දින විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 වර්ෂය සඳහා දිස්ත්‍රික් තොරතුරු මධ්‍යස්ථාන 10 ක් ස්ථාපිත කිරිමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් කිසිදු තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කර නොතිබුණි.

(ii) 2014 වර්ෂයේ අවිච්ඡේද වූ දිස්ත්‍රික් තොරතුරු මධ්‍යස්ථාන 06 කින් 04 ක් කළුතර, පුත්තලම, ගාල්ල හා මාතලේ දිස්ත්‍රික්කවල පමණක් ස්ථාපිත කර තිබුණි. එයින් මධ්‍යස්ථාන 03 ක් විවෘත කර තිබුණ අතර මාතලේ මධ්‍යස්ථානය පරිපාලනමය හේතුවක් මත වසරකට ආසන්න කාලයක් විවෘත කිරීමට නොහැකි වී තිබුණි.

(iii) තොරතුරු මධ්‍යස්ථාන ක්‍රියාත්මකවීම පිළිබඳව පසු විපරම් කිරීමක් අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි.

(iv) වවුනියාව දිස්ත්‍රික් තොරතුරු මධ්‍යස්ථානය සඳහා පරිගණක මේස හා පුටු මිලදී ගැනීමට ලබා දුන් රු.436,000 ක ප්‍රතිපාදනය වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබුණි.

(v) අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද 2014 වර්ෂයේ ව්‍යාපෘති වාර්තාව අනුව එක් එක් දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා අදාළ ගොඩනැගිල්ල දිස්ත්‍රික් ලේකම් විසින් සපයා ගත යුතු වුවත්, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා පමණක් නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2014 මැයි 30 දින ඉහත මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා මුල්ගල තබා තිබුණද, ගොඩනැගිල්ල ඉදිකිරීමේ සැලැස්ම දිස්ත්‍රික් ලේකම්වරයා වෙත 2014 ජුලි 29 දින

ඉදිරිපත් කර තිබුණි. එමෙන්ම මුල්ගල තැබීමේ සමාරම්භක උත්සවය සඳහා පුවත්පත් දැන්වීම පළකිරීම හා මුද්‍රණ කටයුතු සඳහා රු.454,200 ක් වැය කර තිබුණි.

- 2015 නොවැම්බර් 23 දින ගොඩනැගිල්ලේ II අදියර සඳහා නව කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණ අතර, එම අදියර සඳහා රු. 1,718,020 ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණි. ගිවිසුම අනුව 2015 දෙසැම්බර් 20 දින හෝ ඊට ප්‍රථම ඉදිකිරීම් නිමකර භාරදිය යුතුව තිබුණද, විගණිත දිනය වූ 2016 ජූලි 30 දින වන විටත් අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම නිමකර නොතිබුණි.

- ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අමාත්‍යාංශය ප්‍රතිපාදන මුදල් ලබා දෙනු ලැබුවද එහි පසු විපරම් කටයුතු ඉතා දුර්වල මට්ටමක පැවතිණි. 2014 වර්ෂයේ සිට 2016 ජූලි 11 දින වනතුරුත් දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කර නොතිබුණි.

(vi) දිස්ත්‍රික් තොරතුරු මධ්‍යස්ථාන 25 ක් සඳහා තොරතුරු තාක්ෂණ නිලධාරීන් 25 දෙනෙකු බඳවා ගැනීමට අනුමත කරගෙන තිබුණු අතර කිසිදු සේවකයකු බඳවා ගැනීමට අපොහොසත් වී තිබුණි.

**(ඈ) යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානය**

**------------------------------------------**

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂවලදී ක්‍රියාත්මක කළ යාපනය තොරතුරු තාක්ෂණ උද්‍යානය ව්‍යාපෘතිය 2015 සැප්තැම්බර් 21 දින සිට විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාක්මක කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 19.49 ක් වාර්ෂිකව වැය කර තිබුණද, පරිගණක පුහුණුව 444 දෙනෙකුට පමණක් ලබා දී තිබුණි.

(ii) සෑම වසරකම මාස 06 කට වරක් කාර්යාල කළමනාකරණ ඩිප්ලෝමාව හා ජාත්‍යන්තර විද්‍යුත් තැපැල පිළිබඳ වැඩමුළු 01 ක් පමණක් පවත්වා තිබුණු අතර වැය කළ මුදල සමඟ සැසඳීමේදී එහි ප්‍රගතිය ප්‍රමාණවත් වී නොතිබුණි.

**(ඇ) තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය මගින් සිදුකරන ලද ව්‍යාපෘති**

**------------------------------------------------------------------------**

තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රගති වාර්තාව අනුව ව්‍යාපෘති වියදම රු.මිලියන 317.90 ක් වූ අතර ඉන් රු.මිලියන 106.70 ක් ආයතන හා පරිපාලන කටයුතු සඳහා වැය කර තිබුණි. එය සමස්ථ වියදමෙන් සියයට 33 ක් වී තිබුණි. 2015 වර්ෂය ආරම්භයේදීම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් උපදේශකත්ව සේවාවන් සියල්ලම, වර්ෂය මුලදී සැලැසුම් කර තිබූ අතර, ව්‍යාපෘති වියදම යටතේ ආයතනය පවත්වා ගැනීමට සහ සියළු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික හා මෙහෙයුම් වියදම් ඇතුළත් කර ඇති බව ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් ප්‍රධාන වැඩසටහන් යටතේ ඉටුකිරීමට අපේක්ෂා කරන කාර්යයන් වෙන් වෙන් වශයෙන්

සඳහන් නොකිරීම නිසා නියෝජිත ආයතනය විසින් ඉදිරිපත් කර ඇති භෞතික ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්මට අනුව සැසඳීමට නොහැකි වී තිබුණි.

(iii) භෞතික ප්‍රගති වාර්තාව අනුව එක් එක් වැඩසටහන යටතේ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොකරණ ලද කාර්යයන් 21 ක් වූ අතර ප්‍රගතිය සියයට 50 කට වඩා අඩුවෙන් අත්කරගෙන තිබූ කාර්යයන් 08 ක් විය.

**3.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-----------------------------------------

**අක්‍රීය බැංකු ගිණුම්**

----------------------

අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ බැංකු ගිණුමක රු.200,500 ක ශේෂයක් පැවැති අතර, 2015 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 01කට අඩු කාලයක් මුළුල්ලේ මෙම ගිණුම අක්‍රීයව පැවතුණි.

**3.7 අවිධිමත් ගනුදෙනු**

----------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

------------------------------------------------------------------------------------

**(අ) ටැබ්ලට් පරිගණක මිලදී ගැනීම රු. 1,077,300**

---------------------------------------------------------

One Government 2020 වැඩමුළුව සමගාමීව දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සැලැස්ම සකස් කර ගැනීම හා එම සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා කාර්යක්ෂම සන්නිවේදනයක් දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ පවත්වා ගත යුතුව තිබුණි. ඊට මූලික පදනමක් වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් සඳහා ටැබ්ලට් පරිගණක ලබාදීම අවශ්‍යතාවයක් ඇති බව පෙන්වා දෙමින් ටැබ්ලට් පරිගණක 27 ක් රු.1,077,300 ක් වැය කර මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) Huawei m18’’ Android වර්ගයේ ටැබ්ලට් පරිගණක 25 ක් එකක් රු.39,900 බැගින් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණද, ටැබ්ලට් පරිගණක 27 ක් 2014 දෙසැම්බර් 29 දින හා 2014 දෙසැම්බර් 30 දින මිලදී ගෙන තිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම්වරුන් සමග කාර්යක්ෂම සන්නිවේදනයක් සඳහා මෙම මිලදී ගැනීම් සිදුකර තිබුණද, මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙතද ටැබ්ලට් පරිගණකයක් ලබාදී තිබුණි.

(iii) කළුතර, මුලතිව්, මන්නාරම, මඩකලපුව, අම්පාර, බදුල්ල හා කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබා දුන් ටැබ්ලට් පරිගණක සඳහා ලැබීම් නියෝග ලබාදී නොතිබුණි.

(iv) මෙම මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ගිවිසුමකට එළඹ නොතිබුණි.

**(ආ) අමාත්‍ය කාර්යාලය අළුත්වැඩියාව සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීම**

**-------------------------------------------------------------------------------**

අමාත්‍ය කාර්යාල පරිශ්‍රය අළුත්වැඩියා කිරීම සඳහා 2015 සැප්තැම්බර් 15 දින රු.621,455 ක් හා නාන කාමරය අළුත්වැඩියා කිරීම සඳහා 2015 දෙසැම්බර් මාසයේදී රු.978,442 ක් ද වශයෙන් එකතුව රු.1,599,897 ක් වැය කර තිබුණි. තවද 2015 ඔක්තෝබර් මාසයේදී රු.337,500 ක් හා 2015 දෙසැම්බර් මාසයේදී රු.442,550 ක් ද වශයෙන් එකතුව රු.780,050 ක් වැය කර ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම මිලදී ගැනීම් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8.1 මාර්ගෝපදේශයේ විධිවිධාන අනුගමනය කළ නොහැකි වුවත්, එම මාර්ගෝපදේශ පදනම් කරගෙන අදාළ වන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර මිලදී ගැනීම සිදු කර තිබුණි.

(ii) ඉහත සඳහන් අළුත්වැඩියාව සිදුකිරීමේදී තාක්ෂණික දැනුම ඇති නිලධාරියෙකු ලවා ප්‍රමාණ පත්‍ර (BOQ) පිළියෙල කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. එසේ ප්‍රමාණ පත්‍ර පිළියෙල නොකිරීම හේතුවෙන් ආයතන 03 ක් විසින් ඉදිරිපත් කර තිබූ ලංසු එකිනෙකට සසඳා නිවැරදි අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු තෝරාගත් ආකාරය පැහැදිලිව සඳහන් කිරීමට නොහැකි වී තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී රු.මිලියනයකට වැඩි වූ ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අධිකාරය ලබාගත යුතු වුවත්, මෙම ප්‍රසම්පාදනය සඳහා එම අධිකාරය ලබා ගෙන නොතිබුණි.

(iv) අමාත්‍ය කාර්යාල පරිශ්‍රය අළුත්වැඩියා කිරීම, නාන කාමරය අළුත්වැඩියා කිරීම හා කාර්යාල උපකරණ මිලදී ගැනීම යන ප්‍රසම්පාදනවලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

**3.8 අනාර්ථික ගනුදෙනු**

**---------------------**

අමාත්‍යාංශයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අනාර්ථික ස්වභාවයේ ගනුදෙනු නිරීක්ෂණය විය.

(අ) 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින සියළුම ආයතනයන්හි කාර්යාල හැකිතාක් දුරට රජයේ හෝ රාජ්‍ය සංස්ථාවලට අයත් ගොඩනැගිලිවල පවත්වා ගත යුතුව තිබුණි. 2015 වර්ෂයට පෙර පැවැති විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය සහ මෙම අමාත්‍යාංශය 2010 වර්ෂයේ සිට කාලය දීර්ඝ කරමින් පෞද්ගලික ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 16.03 ක් වැය කර තිබුණි.

(ආ) 2012 ජූලි 04 දින පැවැති රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය වෙත නිකුත් කළ නියෝගයට අනුව කාර්යාල ගොඩනැගිල්ල සඳහා වැය කර ඇති අධික වියදම් පාලනය කරගැනීම පිණිස කාර්යාල ගොඩනැගිල්ල මාස 06 ක කාල

සීමාවක් ඇතුළත වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපනය කරගැනීමට එකඟවී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම නියෝගය ඉටු කර නොතිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යා පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 08 | 04 |
| (ii) | තෘතීයික මට්ටම | 29 | 02 | 27 |
| (iii) | ද්විතික මට්ටම | 33 | 19 | 14 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 20 | 15 | 05 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | **එකතුව** | **95** | **45** | **50** |

(i) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 50 ක් පැවතී තිබුණත් 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරිවී තිබීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩල පුරප්පාඩු හේතු වී නොතිබුණි.

(ii) 2010 මැයි 14 දිනැති අංක CA/I/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරයාගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩල 15 ක් බැගින් විය යුතු වුවද, එය 21 දෙනෙකු බැගින් යොදවා ගෙන තිබුණි.